කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : **05** MSW/26/10/26/01

වර්ණය : රතු

**තද සුළං සහ මුහුද රළුවීම පිළිබඳ අනතුරු ඇඟවීමේ නිවේදනය**

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින් ඉදිරි පැය 12 සඳහා වලංගු වන පරිදි, 2026 ඔක්තෝබර් මස 26 දින පෙ.ව. 09.30 ට නිකුත් කරන ලදී.**

## බෙංගාල බොක්ක ගැඹුරු නොගැඹුරු මුහුදු ප්‍රදේශයේ යාත්‍රාකරන බහුදින ධීවර යාත්‍රා සඳහා.

**ක්‍රියාත්මක වන්න!**

**බෙංගාල බොක්කේ නැගෙනහිර-මධ්‍යම සහ ඊට යාබද ගිනිකොණදිග මුහුදු ප්‍රදේශයේ පැවති ගැඹුරු පීඩන අවපාතය, "ඔර්නබ්" සුළි කුණාටුව දක්වා වර්ධනය වී ඇත. එය බටහිර දෙසට ගමන් කර ඇති අතර, අද දින (2026 ඔක්තෝබර් 26) පෙ.ව. 5.30 වන විට උතුරු අක්ෂාංශ 15.4 සහ නැගෙනහිර දේශාංශ 88.9 ආසන්නයේ කේන්ද්‍රගතව පැවතුනි. මෙම පද්ධතිය බොහෝ දුරට බටහිරට බරව වයඹ දෙසට ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, 2026 ඔක්තෝබර් 26 වන දින ප.ව. 23.30 වන විට බටහිර -මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේදී එය තවදුරටත් වර්ධනය වී චණ්ඩ සුළි කුණාටුවක් බවට පත්වීමට ඉඩ ඇත.**

**"අවවාදාත්මක" කාණ්ඩයට අයත් මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැයට කිලෝමීටර 80-100 දක්වා ඉහළ යා හැකි අතර, ගිගුරුම් සහිත තද වැසි ඇති විය හැක. එමෙන්ම මෙම මුහුදු ප්‍රදේශවල මුහුදු රළ උස මීටර් (3.0 – 4.0) ක් පමණ ඉහළ යාමේ හැකියාවක් පවතින අතර මෙම මුහුදු ප්‍රදේශ ඉතා රළු විය හැක.**

**එමනිසා උතුරු අක්ෂාංශ 10 ත් 20 ත් සහ නැගෙනහිර දේශාංශ 80 ත් 95 ත් අතර මුහුදු ප්‍රදේශවල නැවත දැනුම් දෙන තුරු ධීවර සහ නාවුක කටයුතුවලින් වළකින ලෙසත් එම මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවික කටයුතු වල යෙදෙන ප්‍රජාවන් ආරක්ෂිත ප්‍රදේශ කරා යාත්‍රා කරන ලෙසත් උපදෙස් දෙනු ලැබේ.**

**Warning for Fishing and Naval Communities.**
**Issued at 09.30 a.m. on 26 October 2026. Valid for the period until 09.30 p.m. 26 October 2026.**




**ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිළිබඳව අවධානයෙන් පසුවන ලෙසත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ඉදිරි නිවේදන සහ අනාවැකි සම්බන්ධයෙන් විමසිලිමත් වන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ.**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**පුරෝකථනය කරන ලද ස්ථාන සහ තීව්‍රතා:**

| දිනය - වේලාව | ස්ථානය (උතුරු අක්ෂාංශ/ නැගෙනහිර දේශාංශ) | කැළඹිලි ස්වභාවය |
|---|---|---|
| 26/10/2026 - පෙ.ව. 5.30 | 15.4/88.9 | සුළි කුණාටුව |
| 26/10/2026 - පෙ.ව. 11.30 | 15.5/88.1 | සුළි කුණාටුව |
| 26/10/2026 - ප.ව. 5.30 | 15.6/87.3 | සුළි කුණාටුව |
| 26/10/2026 - ප.ව. 11.30 | 15.7/86.4 | චණ්ඩ සුළි කුණාටුව |
| 27/10/2026 - පෙ.ව. 5.30 | 15.8/85.7 | චණ්ඩ සුළි කුණාටුව |
| 27/10/2026 - ප.ව. 5.30 | 15.9/84.2 | ඉතා චණ්ඩ සුළි කුණාටුව |
| 28/10/2026 - පෙ.ව. 5.30 | 16.5/82.6 | ඉතා චණ්ඩ සුළි කුණාටුව |
| 28/10/2026 - ප.ව. 5.30 | 17.6/81.5 | සුළි කුණාටුව |

**නිරීක්ෂණය කළ සහ පුරෝකථනය කළ ගමන් මාර්ගය:**




**Source : https://rsmcnewdelhi.imd.gov.in/**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk